# අපේ අතීත විත්ති

## පාඩම් අංක 16.

ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. අනුරාධපුරය අංග සම්පූර්ණ රාජධානියක් බවට පත් කළ රජු වන්නේ,

1. නිශ්ශංකමල්ල රජතුමා 2. දුටුගැමුණු රජතුමා 3. පණ්ඩුකාභය රජතුමා

02. ලෝක උරුම නගරයක් වන්නේ,

1. කොළඹ 2. මහනුවර 3. කැළණිය

03. සීගිරි බලකොටුව අයත් දිස්ත්‍රික්කය වන්නේ,

1. මහනුවර 2. බදුල්ල 3. මාතලේ

04. "අනුරාපුර පොළොන්නරුව සීගිරි මන බන්දනීය" මෙය,

1. ජන කවියකි. 2. විරිඳුවකි. 3. දේශාභිමාන ගීයකි.

05. "මේ කලා වැව නිල් දියකඳ මගේ දායාදයයි" මෙම ප්‍රකාශය කළේ,

1. ධාතුසේන රජතුමා 2. දුටුගැමුණු රජතුමා 3. මහා පරාක්‍රමබාහු රජතුමා

06. ඓතිහාසික වැදගත්කමක් ඇති ස්ථානයක දී කළ යුතු දෙයක් නොවන්නේ,

1. අපිරිසිදු නොකිරිම. 2. අනවශ්‍ය දේ ලිවීම. 3. පිළිම මත වාඩි වීම.

07. සොළී දේශයේ සිට පැමිණි රජ වුවද සතුරාට, මිතුරාට එකම විදියට සැලකූ රජ කෙනෙකි.

1. නිශ්ශංකමල්ල රජතුමා 2. එළාර රජතුමා 3. කාලිංග මාඝ

08. ලියවැල්, පළාපෙති නිර්මාණයේ දී යොදා ගන්නා ප්‍රධාන වර්ණයකි.

1. රතු 2. කොළ 3. තැඹිලි

09. මල්වතු ඔය හරහා ගල්පාලම පිහිටා ඇති දිස්ත්‍රික්කය වන්නේ,

1. පොළොන්නරුව 2. මහනුවර 3. අනුරාධපුරය

10. අතීතයේ සිට පැවත එන ජන ක්‍රීඩාවක් නොවේ.

1. කැරම් 2. මේවර කෙළිය 3. ඔළිඳ කෙළිය

පිළිතුරු සපයන්න.

01. පහත සඳහන් ස්ථානවල ඓතිහාසික වටිනාකම ලියන්න.

සීගිරිය.

ශ්‍රී පාදය.

දළදා මාලිගාව.

පරාක්‍රම සමුද්‍රය.

ඉසුරුමුණිය.

02. අතීතයේ ශ්‍රී ලංකාව බෙදා තිබුණු කොටස් කීයද? ඒවා ලියන්න.

03. ඓතිහාසික ස්ථානවලදී කළ යුතු දේවල් 2ක් ලියන්න.

04. ඓතිහාසික ස්ථානයක දී නොකළ යුතු දේවල් 2ක් ලියන්න.

05. පහත සඳහන් රජවරුන් කළ සේවාවන්ගෙන් එක බැගින් ලියන්න.

1. දුටුගැමුණු රජතුමා.
2. පණ්ඩුකාභය රජතුමා.
3. දේවානම්පියතිස්ස රජතුමා.
4. මහසෙන් රජතුමා.

06. අතීත කලාකෘතියක් හා බැඳුණු ජනකථාවක් වැඩිහිටියෙකුගෙන් අසා දැනගන්න.

07. ක්ෂේත්‍ර චාරිකාවක දී රැස්කළ තොරතුරු වාර්තා කළ හැකි ක්‍රම 2ක් ලියන්න.

08. අතීත අපේ මුතුන් මිත්තන් පරිභෝජනය කළ ආහාර වර්ග දෙකක්, ඖෂධ වර්ග දෙකක් ලියන්න.

09. "චක්ගුඩු පනිමු" ක්‍රීඩාවේ දී ගුඩු..... ගුඩු.... ගුඩු යනුවෙන් නොනවත්වා කිව යුත්තේ කවුද?

10. පළාපෙති හා ලියවැල් මෝස්තරය බැගින් ඇඳ වර්ණ කරන්න.

සැකසුම :- ඩබ්.ඩී.එන්. වික්‍රමනායක.

කෑ/මාව/ කෙහෙල්පන්නල ක.වි

මාවනැල්ල අධ්‍යාපන කලාපය